Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් රාජ්‍ය සේවයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් | ශිල්පීය නිපුණතා/පළපුරුද්ද |
|---|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික III | 01 | රු. 25,790-270x 10-300x10-330x10-350x12-රු. 38,990 (PL3-2016) | *බාහිර අයදුම්කරුවන් සඳහා* : අ. පො. ස. (සා. පෙළ) විභාග යෙන් යටත් පිරිසෙයින් විෂයයන් 02 ක් වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9වසර) සමත් වී තිබිය යුතුය. | * තනතුරේ කාර්යභාරයට අදාලව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද NVQ 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>* පිළිගත් ආයතනයක අදල ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්දක් තිබීම (සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුවේ.) |
| 02 | රියදුරු III | 01 | රු. 25,790-270x10- 300 x10-330 x10-350x 12-රු. 38,990 (PL3-2016) | *බාහිර අයදුම්කරුවන් සඳහා*: අ. පො. ස. (සා.පෙළ) විභාග යෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් සමත් විය යුතුය.<br><br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා* දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදල ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය. | * තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර්, මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. ( A පන්තියේ රියදුරු බලපත්‍රයක්)<br><br>* වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |

*සැ. යු.-* ඉහත තනතුරු සඳහා දැනටමත් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් ගිවිසුම් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එම බඳවාගැනීමේ දිනට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදල කර ගනු ලැබේ.

02. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවය කරනු ලබන තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම් හා ස්ථිර අයගේ අයදුම්පත් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

03. *වයස* - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

04. වෙනත් සුදුසුකම් :-

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(iii) අයදුම්කරු ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 3කට නොඅඩු කාලයක් තුල ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් සහ ග්‍රාම නිලධාරි සහ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.

(iv) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහකරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතුය.

05. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

(ii) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලකට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

06. *අයදුම්පත්* - අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දක්වෙන ආකෘතියට අනුව පිළියෙල කර ගත් අයදුම්පත් 2018.11.30 දිනට පෙර ''ලේකම්, ප්‍රාදේශීය සභාව, වෙන්නප්පුව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන හා තැපෑලේ දී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

07. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

08. අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකපත්වල පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික
(ඇ) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය සහ ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපත
(ඈ) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරියාගෙන් විය යුතුය)
(ඉ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියළු බලතල වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

ඩබ්. ඩී. ලූෂන්,
ලේකම්,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

*. . . . . . . . තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) :.................................................................
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :.................................................................
02. තැපැල් ලිපිනය :.................................................................
03. උපන් දිනය අවුරුද්ද :.................. මාසය:.................. දිනය:..................
04. අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස ඃ අවුරුදු :............... මාස:............... දින:..................
05. විවාහක/අවිවාහක බව :.................................................................
06. ස්ත්‍රී/පුරුෂ භාවය :.................................................................
07. ජාතිය :.................................................................
08. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද යන වග :.................................
09. අධ්‍යාපන සුදුසුකම් :.................................................................
10. වෘත්තීය සුදුසුකම් :.................................................................
11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් ඃ-
    (i) දැනට දරන තනතුර :.................................................................
    (ii) එම තනතුරට පත් වූ දිනය :.................................................................
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම්) පදනම මත ද? :...............
12. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :...............

මෙහි සඳහන් මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

...........................
අයදුම්කරුගේ අත්සන.

දිනය :..............................

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන.......................... මයා මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ . . . . . වශයෙන් සේවය කරයි. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..............................
ආයතන ප්‍රධානියා.

අත්සන :...................................
නම :...................................
පදවිය :...................................
දිනය :...................................